PR/2019/ S12

# ජපන් තානාපති කාර්යාලය

නො.20, ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629

ඊ-මේල්: cultujpn@sltnet.lk

මාර්තු 06, 2019

## පුවත්පත් නිවේදනය

**ජපන් රජය මගින් ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සහ බලගැන්වීම සඳහා UNFPA හරහා ඩොලර් මිලියන 1.5ක් ලබාදෙයි.**

ජපන් රජය මගින් ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ තරුණ පරපුරට අවශ්‍ය ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය, අයිතිවාසිකම් සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ තොරතුරු සහ සේවාවන් සඳහා වන ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපන් යෙන් මිලියන 163ක් (ඩොලර් මිලියන 1.47) එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදලට ලබාදෙයි. මෙමගින් දීර්ඝකාලීන සාමය ළඟාකරගැනීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය, කාන්තා බලගැන්වීම සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ධනාත්මක වෙනසක් ඇතිකිරීම අරමුණු කෙරේ.

මෙම ව්‍යාපෘතියට අදාල හුවමාරු පත්‍ර සඳහා අත්සත් තැබීම 2019 මාර්තු 06 දින ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත රිටිසු නකේන් මහත්මිය විසින් තානාපති නිලනිවසේදී සිදුකරන ලදී. සෞඛ්‍යය අමාත්‍යංශයේ ලේකම් වසන්තා පෙරේරා මහත්මිය ද මෙම අවස්ථාවට සහභාගී විය.

තරුණ ප්‍රජාවට හිතකර ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යයට අදාල තොරතුරු සහ සේවාවන් සඳහා අවශ්‍ය ප්‍රශෙය වැඩිදියුණු කිරීමත් ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම් පිළිබඳව ජාතික මට්ටමෙන් සහ උතුරු, නැගෙනහිර, දකුණු සහ මධ්‍යම පළාත්වල ප්‍රවර්ධනය කිරීම සඳහාත් මෙම අරමුදල භාවිතා කෙරේ. පවුල් සැලසුම් සඳහා වන ඉල්ලුම, ඒ පිළිබඳ දැණුවත්භාවය, ආකල්ප, උපක්‍රම මෙන්ම ඒ සඳහා පවත්නා බාධා පිළිබඳව පර්යේෂණ කිරීම සහ ජාතික මට්ටමේ ශ්‍රව්‍ය, දෘෂ්‍ය, මුද්‍රිත සහ සමාජ ජාල සඳහා සංවේදිතා වැඩසටහන්ද මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. එමෙන්ම සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය, තරුණ කටයුතු සහ අධ්‍යාපන අමාත්‍යංශයන්හී නිලධාරීන් සඳහා මේ පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදුකෙරේ. තවද ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන් සඳහා පවත්නා නවාතැන්හි ධාරිතාවය දියුණු කිරීම උදෙසා අවශ්‍ය යටිතල පහසුකම් සහ සේවා තවදුරටත් ශක්තිමත් කිරීමද මේ යටතේ සිදුකෙරේ.

ජපන් සහ ශ්‍රී ලංකා රජයන් 2018 අප්‍රේල් මස G7 විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී එකග වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය, කාන්තාවන් බලගැන්වීම හා මානව අයිතිවාසිකම් වලට ගරු කිරීම සහ දිගුකාලීන සාමය පවත්වා ගැනීම සඳහා වන G7 කාන්තාව, සාමය සහ ආරක්ෂාව (WPS) වැඩසටහනේ හවුල්කරුවන් වන අතර මෙම සහාය ජපානය සහ ශ්‍රී ලංකාව අතර WPS න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වන එක් වැඩසටහනකි. (නිමි)

*************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.

සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථනය : 011-2693831-3 දිගු අංකය: 226